# මූලික තොරතුරු

1. හන්තාන යනු කුමක් ද?
2. Fedora යනු කුමක් ද?
3. මොකක්ද මේ ග්නූ/ලිනක්ස් (GNU/Linux)
4. සජීව තැටියක් (LiveCD/DVD) යනු?
5. හන්තාන ස්ථාවර(stable) මෙහෙයුම් පද්ධතියක් ද? නැත්නම් අත්හදාබැලීම් මට්ටමේ තිබෙන පද්ධතියක් ද?
6. හන්තාන වෘත්තීය හෝ කාර්යාලීය පරිසරයක භාවිත කරන්න මට පුළුවන් ද?
7. මා සමග කාර්යාලයේ වැඩ කරන අනිත් අය භාවිත කරන්නේ Windows මෙහෙයුම් පද්ධතියයි. මා පමණක් හන්තාන භාවිතයට යොමු වීමෙන් මට අවාසියක් සිදු වෙයි ද? මා නිපදවන ලිපි ගොනු ආදිය විවෘත කිරීමට හා කියවීමට අනිත් අයට බැරි වෙයි ද?
8. හන්තාන සහ ෆෙඩෝරා අතර වෙනස
9. හන්තාන භාවිතයේදි කල් ඉකුත් වීමක් සිදුවනවාද?
10. ස්ථාපනයට අනුක්‍රමික අංක (සිරියල් අංක) අවශ්‍ය ද?
11. මෘදුකාංග යාවත්කාල කළ හැකි ද?
12. හන්තාන තැටියක විකුණුම් මිල කීයද?
13. මගේ කඩේ හන්තාන විකිණිය හැකි ද? ඒ සඳහා මා කොපමණ මුදලක් ගෙවිය යුතු ද?
14. හන්තාන ව්‍යාපෘතියට අධාර අවශ්‍ය ඇයි?
15. හන්තාන තැටි පිටපත් කර මිතුරන් අතර බෙදාහැරිමට හැකිද?
16. දැනට ඇති අලුත්ම හන්තාන නිකුතුව කුමක්ද?
17. හන්තාන අලුත් වෙළුමක් නිකුත් කරන්නේ කොපමණ කාලයකට පසුද?
18. මීළඟ නිකුතුව කුමක්ද?
19. හන්තාන සමඟ ලැබෙන මෘදුකාංග මොනවද?
20. හන්තාන භාවිත කළාම උබුන්ටු භාවිතයට අපහසුද?
21. හන්තාන මත සිංහල ස්ථාපනය කළ යුතුද?
22. හන්තාන මත mp3, mp4, avi වාදනය කළ හැකි ද?
23. හන්තාන සඳහා skype ස්ථාපනය කළ හැකිද?
24. හන්තාන සමඟ එන LibreOffice වල Office2007 ගොනු විවෘත කළ හැකි ද?
25. MS Windows සමඟ හන්තාන එකම පරිගණකයේ ස්ථාපනය කළ හැකි ද? එමගින් පරිගණකයේ වේගය අඩු වේවිද ?
26. වෛරස්ගාඩ් එකක් අවශ්‍ය ද?
27. මගේ ඩොංගල් එකෙන් ඉන්ටනෙට් යන්න Mobile Partner ස්ථාපනය කරන්න ඕනද? ඒ වෙනුවට වෙන විසඳුමක් තියෙනවද?
28. හන්තාන ලිනක්ස් තියන ගැටලු විසඳා ගන්නේ කොහොමද?
29. මට ඊමේල් ගොඩක් එන එක කරදරයි හන්තාන අඩවියේ අලුත් තොරතුරු පමණක් ගන්න ක්‍රමයක් නැද්ද?
30. මට හන්තාන ව්‍යාපෘතියට සහාය විය හැකි ද?

# ස්ථාපනය

1. හන්තාන ස්ථාපනය කරගන්න අවශ්‍ය අවම දෘඩාංග පහසුකම් මොනවා ද?
2. හන්තාන ගන්නේ කොහොම ද?
3. හන්තාන බිට් 64 පරිගණක මත (AMD-64 හෝ Intel-64) ක්‍රියාත්මක කළ හැකිද?
4. හන්තාන ස්ථාපනය කරන්නේ කොහොමද?
5. කොහොමද හන්තාන ඩුවල් බූට් ලෙස දාන්නේ

6. මගේ NTFS (Windows NT/2000/XP/2003) පාටිශන් බලාගන්නේ කොහොමද?

## Desktop සැකසුම්

1. Desktop Effects / ඩෙස්ක්ටොප් රංගසැරසිලි සක්‍රිය කරන්නේ කොහොමද?
2. මගේ පරිගණකයේ Desktop Effects වැඩකරන්නේ නෑ.
3. පරිගණකය වසාදමන්නේ කොහොමද? Shutdown තිබෙන තැන හොයාගන්න බෑ.

## කාර්යාලීය යෙදුම්

1. හන්තාන එකේ තියෙන LibreOffice වලින් ලියුමක් ලියලා මම MS Office තියෙන පරිගණකයකට ගෙනියන්නේ කොහොමද?
2. ලියුමක් PDF බවට පත් කරගන්න පුළුවන්ද?
3. LibreOffice විතරද? ඇයි OpenOffice.org නැද්ද?
4. සිංහලෙන් ලියන්නේ කොහොමද?
5. සිංහලෙන් ලියන්න මම ෆොන්ට දාගන්න ඕනද?
6. LibreOffice මත සිංහල අකුරු bold කළ විට කොටු එනව, "ශ්‍රී" වැනි අකුරු ලියවෙන්නේ "ශ්රී" ලෙස. කොහොමද හදා ගන්නේ?

## මෘදුකාංග කළමනාකරණය

1. හන්තාන මත මෘදුකාංගයක් ස්ථාපනය කරන්නේ කොහොමද ?
2. හන්තාන තුළ ඇති මෘදුකාංග යාවත් කාල කරන්නේ කොහොම ද?
3. හන්තාන තුළ ඇති මෘදුකාංග ඉවත් කරන්නේ කොහොමද?
4. හන්තාන තුළ exe ගොනු ස්ථාපනය කළ හැකිද ? කොහොමද කරන්නේ?

## ජාල සැකසුම්

1. පරිගණකයේ IP ලිපිනය සහ අනෙකුත් තොරතුරු දෙන්නේ කොහොමද?
2. මගේ Dongle එකෙන් අන්තර්ජාලයට යන්නේ කොහොම ද?
3. හන්තාන ලිනක්ස් ස්ථාපනය කළා, නමුත් අන්තර්ජාලයට පිවිසෙන්න බෑ
4. මගේ අන්තර්ජාල සේවාදායකයාගේ (ISP) DNS දැනගන්නේ කොහොමද?

## පරිශීලක කළමනාකරණය

1. මගේ මුරපදය (password) වෙනස් කරගන්නේ කොහොම ද?
2. හන්තාන මත අලුතින් ගිණුමක් හදන්නේ කොහොමද ?
3. හන්තාන තුළ ඇති ගිණුමක් මකන්නේ කොහොම ද?
4. හන්තාන තුළ ඇති ගිණුමක් වෙනස් කරන්නේ කොහොමද?

# ආරක්ෂක සැකසුම්

1. මොකක්ද මේ SELinux?
2. SELinux නිසා මගේ එදිනෙදා කටයුතුවලට කුමක් වෙයිද?
3. SELinux සක්‍රිය/අක්‍රිය කරන්නේ කොහොමද ?

# ජංගම දුරකථන සැකසුම්

1. මගේ ජංගම දුරකථනයේ/ඩොංගලයේ ඇති SMS සහ Contacts මට හන්තාන මතදී බලාගත හැකිද?

# වෙනත්

1. හන්තාන ලිනක්ස්හි touch pad tapping වැඩ කරන්නෙ නෑ. ඒක හදා ගන්නෙ කොහොමද?
2. මගේ හාඩ් ඩිස්ක් එකෙ ඉඩ බලාගන්නේ කොහොමද?
3. අන්තර්ජාල වේගය, CPU, Memory භාවිතය බලාගන්නේ කොහොමද?
4. ඩිස්ක් එකේ තියෙන ෆයිල් එකක් හොයාගන්නේ කොහොමද?
5. ලිනක්ස්හි විධානයක් පිළිබඳ වැඩි විස්තර සොයාගන්නේ කෙසේද?
6. හන්තාන සිංහල අතුරු මුහුණතට පිවිසෙන්නෙ කොහොමද?
7. terminal යනු කුමක් ද?
8. root යනු කුමක් ද?

# මූලික තොරතුරු

1. හන්තාන යනු කුමක් ද?

හන්තාන ලිනක්ස් යනු ශ්‍රී ලාංකික පරිගණක පරිශීලකයාට වඩාත් උචිත වන අයුරින් සුප්‍රකට Fedora මෙහෙයුම් පද්ධතිය වෙනස් කර සැකසූ පරිගණක මෙහෙයුම් පද්ධතියක්. මෙය නොමිලේ බෙදාහරිනු ලබන අතර සීමාවකින් තොර ව නැවත නැවතත් බෙදාහැරීමට සම්පූර්ණ නිදහස සහිතයි. වෙනත් වචනවලින් කියනොත් මෙය නිදහස් හා විවෘත මෙහෙයුම් පද්ධතියක්. සජීවී තැටියක් ලෙස මෙය නිර්මාණය කර ඇති නිසා ස්ථාපනය කිරීමෙන් තොරව මෙම මෙහෙයුම් පද්ධතිය භාවිත කර බැලීමෙ හැකියාව තිබෙනවා.

ඉහළට

2. Fedora යනු කුමක් ද?

Fedora යනු Red Hat සමාගමේ අනුග්‍රහය ඇතිව ප්‍රජාව විසින් දියුණු කරන ලද ලිනක්ස් මෙහෙයුම් පද්ධතියක්. මෙය නොමිලේ ලබාගත හැකි අතර සැමවිටකම පාහේ අනෙකුත් ලිනක්ස් බෙදාහැරීම් වලට ප්‍රථම නවතම තාක්ෂණික වර්ධනයන් නිදහස් මෘදුකාංග ලොවට මුදාහරිනවා. Fedora මෙහෙයුම් පද්ධතියේ අලුත් වෙළුමක් සෑම මාස හයකට පමණ වරක් නිකුත් වෙනවා.

ඉහළට

3. මොකක්ද මේ ග්නූ/ලිනක්ස් (GNU/Linux)

ග්නූ (GNU - GNU is Not Unix) කියන්නෙ සම්පූර්ණයෙන්ම නිදහස් මෘදුකාංග වලින් Unix මෙහෙයුම් පද්ධතියට සමාන මෙහෙයුම් පද්ධතියක් සංවර්ධනය කිරීමට දියත් කළ ව්‍යාපෘතියක්. මෙම ව්‍යාපෘතියට වැඩසටහන් (applications), පුස්තකාල (libraries) සහ සංවර්ධක මෘදුකාංග වගේ මෘදුකාංග සමූහයක් අඩංගු වෙනවා. ලිනක්ස් (Linux) කියල හඳුන්වන්නෙ සම්පත් කළමනාකරණයට සහ දෘඩාංග සමඟ ගනුදෙනු කරන්න පුළුවන් මෘදුකාංගයක්. මේ කොටස් දෙකම එනම් ග්නූ සහ ලිනක්ස් එකතුවෙලා තමයි ග්නූ/ලිනක්ස් හැදිල තියෙන්නෙ. අද අපි නිකන්ම ලිනක්ස් කියල කිව්වට ඇත්තටම මේ බොහෝ පද්ධතීන් නියම විදියට හඳුන්වන්න ඕන ග්නූ/ලිනක්ස් යන නමින්.

ඉහළට

4. සජීව තැටියක් (LiveCD/DVD) යනු?

ස්ථාපනය කිරීමකින් තොරව මෙහෙයුම් පද්ධතියක් ධාවනය කළ හැකි ආකාරයට සැකසූ CD/DVD තැටියක් සජීව තැටියක් වශයෙන් හැඳින්වෙනවා. උදාහරණයක් ලෙස ඔබගේ පරිගණකයේ ස්ථාපනය කර ඇති මෙහෙයුම් පද්ධති එසේම තිබියදී සජීවී තැටියක ඇති මෙහෙයුම් පද්ධතියක් යොදාගනිමින් පරිගණකය පණ ගන්වා ඒ බාහිර මෙහෙයුම පද්ධතිය පාවිච්චි කළ හැකියි.

ඉහළට

5. හන්තාන ස්ථාවර(stable) මෙහෙයුම් පද්ධතියක් ද? නැත්නම් අත්හදාබැලීම් මට්ටමේ තිබෙන පද්ධතියක් ද?

හන්තාන ස්ථාවර මෙහෙයුම් පද්ධතියක්. එය ෆෙඩෝරා මෙහෙයුම් පද්ධතිය පාදක කරගෙන තිබෙන නිසා එහි තිබෙන සියලු ම වාසි, ආරක්ෂාව සහ ශක්තීන් මෙහි ද ඇතුළත් වෙනවා.

ඉහළට

6. හන්තාන වෘත්තීය හෝ කාර්යාලීය පරිසරයක භාවිත කරන්න මට පුළුවන් ද?

අනිවාර්යයෙන් ම පුළුවන්.

ඉහළට

7. මා සමග කාර්යාලයේ වැඩ කරන අනිත් අය භාවිත කරන්නේ Windows මෙහෙයුම් පද්ධතියයි. මා පමණක් හන්තාන භාවිතයට යොමු වීමෙන් මට අවාසියක් සිදු වෙයි ද? මා නිපදවන ලිපි ගොනු ආදිය විවෘත කිරීමට හා කියවීමට අනිත් අයට බැරි වෙයි ද?

ඔබට කිසි ම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ඔබ හන්තාන ලිනක්ස් තුළ නිපදවන ලිපිලේඛන, ග්‍රැෆික් හෝ වෙනත් ගොනු ඕනෑ ම මෙහෙයුම් පද්ධතියක් තුළ විවෘත කොට කියවීමටත් නැවත සැකසීමටත් පුළුවන්. ඊට අමතරව පරිගණක ජාලයක් හරහා බෙදාගන්නටත්, මුද්‍රණය කරගන්නටත් හැකියි. ඔබේ කාර්යාලීය කටයුතුවලට මෙයින් අහිසි බලපෑමක් සිදු වෙන්නේ නැහැ. මෘදුකාංග සඳහා යන වියදම නතර වීම නිසා ඔබට විශාල වාසියක් නම් අත් වෙනවා. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා හන්තාන ලිනක්ස් ගුණාංග පිටුව බලන්න.

ඉහළට

8. හන්තාන සහ ෆෙඩොරා අතර වෙනස

හන්තාන හා ෆෙඩෝරා ගත් කල හන්තාන ලිනක්ස් බහුමාධ්‍ය යෙදුම් සඳහා අවශ්‍ය ෆෙඩොරා සමඟ නිකුත් නොකර පැකේජ එකතුවක් ඇත. ෆෙඩොරා නිකතුවක් සෑම මාස හයකට වරක් නිකුත් වෙනවා. මෙහිදී ඔබ යම්කිසි ෆෙඩෝරා නිකුතුවක් අදාල නිකුතු දිනයට මාස කිහිපයකට පසු ලබා ගත්තද ලැබෙන iso ගොනුව තුල අඩංගුවන්නේ මුල් නිකුතුවේ අඩංගු පැකේජ පමණි. නමුත් හන්තාන නිකුතුවට අදාල iso ගොනුව වරින් වර නිෂ්පාදනය කරන බැවින් අදාළ දිනට නියමිත යාවත් කිරීම්ද මෙම CD/DVD iso තැටිය සමඟින් ලැබෙනවා.

ඉහළට

9. හන්තාන භාවිතයෙදී කල් ඉකුත් වීමක් සිදුවනවාද?

නැහැ. ඒත් ඔබට අවශ්‍යය නම් අපේ නවතම නිකුතුව ස්ථාපනය කරගන්න පුළුවන්.

ඉහළට

10. ස්ථාපනයට අනුක්‍රමික අංක (සීරියල් අංක) අවශ්‍ය ද?

නැහැ. ඒ කිසිවක් අවශ්‍ය නෑ.

ඉහළට

11. මෘදුකාංග යාවත්කාල කළ හැකි ද?

ඔව්. ඔව්. හන්තාන එක් නිකුත්වක් ස්ථාපනය කළ පසු අවුරුද්දක් පුරා මෘදුකාංගවල අලුත් වීම් ඔබට ලැබෙනවා. ඒවා ඔබේ කැමැත්තේ පරිදි එක් කරගන්න පුළුවන්. ඔබේ පරිගණකය අන්තර්ජාලයට සම්බන්ධව තිබේ නම්

ඔබට මෙනුව මඟින් Activities > Applications System Tools > Software Update ඔස්සේ හෝ ටර්මිනලය මත su -c 'yum update' හෝ su -c 'pkcon update' විධානය (හා අවශ්‍ය ඕනෑ ම විටක දී root පරිශීලකගේ අවසර පදය) ලබා දී මෘදුකාංග යාවත්කාල කළ හැකියි.

ඉහළට

12.හන්තාන තැටියක විකුණුම් මිල කීයද?

නොමිලේ! හන්තාන වෙබ් අඩවිය හරහා හෝ ඔබේ මිතුරකු සතු පිටපත් නොමිලේ ලබාගත හැකියි.

ඉහළට

13.මගේ කඩේ හන්තාන විකිණිය හැකි ද? ඒ සඳහා මා කොපමණ මුදලක් ගෙවිය යුතු ද?

ඔව්! ඔබට හන්තාන සජීව තැටි විකිණිය හැකියි. ඒ සඳහා අපට කිසිදු ගෙවීමක් කිරීම අනිවාර්ය නෑ. ඔබට හැකි නම් මෙම ව්‍යාපෘතියට දායක වීමක් හැටියට සලකා අධාර කළ හැකියි. ඔබට පාරිභෝගිකයන්ට දැරිය හැකි සාධාරණ මිලකට අලෙවි කිරීම සඳහා අවසර තියෙනවා

ඉහළට

14.හන්තාන ව්‍යාපෘතියට අධාර අවශ්‍ය ඇයි?

අප මේ ව්‍යාපෘතිය දියත් කරන්නේ මූල්‍යමය ලාභයක් අත්පත් කරගැනීමේ අරමුණකින් තොරව හුදෙක් සමාජීය මෙහෙවරක් හැටියටයි. නමුත් අපේ ඩොමේන් නාම සඳහාය, සර්වර් පවත්වාගෙන යාමට, පොස්ටර් මුද්‍රණයට හා වැඩසටහන්වල දී සිසුන්ට නොමිලේ සජීවී තැටි සහ සටහන් බෙදා දීමට මුදල් වියදම් කිරීම අවශ්‍ය වෙනවා.

ඉහළට

15.හන්තාන තැටි පිටපත් කර මිතුරන් අතර බෙදාහැරීමට හැකිද?

හන්තාන ඔබ අතට පත් වනුයේ සපුරා ම නොමිලේ හා නිදහස් ව බැවින් එය පිටපත් කිරීමට හා අනයයන් සමග බෙදාහදාගැනීමට ඔබට සම්පූර්ණ නිදහස හිමියි. එසේ කරන මෙන් අපි ඔබව දිරිගන්වනවා!

ඉහළට

16.දැනට ඇති අලුත්ම හන්තාන නිකුතුව කුමක්ද?

15.1

ඉහළට

17.හන්තාන අලුත් වෙළුමක් නිකුත් කරන්නේ කොපමණ කාලයකට පසුද?

Fedora මෙහෙයුම් පද්ධතියේ අලුත් නිකුතුවකින් ටික කලකට පසු ඊට අනුරූප හන්තාන වෙළුම නිකුත් කරනවා. එම නිකුත් කරන දිනය තෙක් සියලු යාවත්කාල එයට ඇතුළත් වෙනවා.

ඉහළට

18.මීළඟ නිකුතුව කුමක්ද?

හන්තාන 16

ඉහළට

19.හන්තාන සමඟ ලැබෙන මෘදුකාංග මොනවද?

ඔබගේ එදිනෙදා වැඩ, කාර්යාලීය වැඩ සහ ග්‍රැෆික් නිර්මාණ සහ ක්‍රමලේඛනය ආදී විශේෂ කාර්යන් ඉටු කර ගැනීමට යෝග්‍ය මෘදුකාංග ඔබට හන්තාන නිකුතුව සමඟ නොමිලේ ලැබෙනවා. හන්තාන තුළ අඩංගු මෘදුකාංගවල සම්පූර්ණ ලැයිස්තුවක් සඳහා http://hanthana.org/features.php බලන්න.

ඉහළට

20.උබුන්ටු භාවිත කළාම හන්තාන භාවිතයට අපහසුද?

හන්තාන යනු Fedora ලිනක්ස් නිකුතුව මත පදනම්වූ මෙහෙයුම් පද්ධතියක්. Ubuntu සහ Fedora යනු වෙනස් ආයතන දෙකකින් නිපදවෙන මෙහෙයුම් පද්ධති දෙකක්. උදාහරණයක් ලෙස Ford ආයතනයෙන් නිපදවන Fiesta මාදිලියේ සහ Nissan ආයතනයෙන් නිපදවන Micra මාදිලියේ කාර් රථ දෙකක් සංසංදනය කර බලමු. වාහන දෙකම වේගය පහසුකම් සහ ඉඩකඩ ආසන්න ලෙස එකිනෙකට සමාන වුවත් ඇතුළත සහ පිටත පෙනුම සුළු වශයෙන් වෙනස්. මේ ආකාරයට Ubuntu සහ Fedora අතර සුළු සුළු වෙනස්කම් දකින්න ලැබුණත් එක මාදිලියක වාහනයක් පැදවූ අයෙකුට වෙනත් වාහනයක් භාවිතයට ඉක්මනින් හුරුවෙන ලෙස අවශ්‍ය විටක එකකින් අනිකට ඉක්මනින් සහ පහසුවෙන් මාරු වීමට හැකියාව ලැබෙනවා. තවද Fedora යනු ඉතා ඉක්මනින් පරිශීලකයන් වෙත නවතම ගුණාංග ලබා දෙන නිකුතුවක්. Fedora පද්ධතිය වඩා පහසුවන ලෙස සැකසූ හන්තාන භාවිතය උබුන්ටු භාවිත කළ අයෙක්ට ඉතා පහසු වෙනවා නොනුමානයි.

ඉහළට

21.හන්තාන මත සිංහල ස්ථාපනය කළ යුතුද?

නැත. හන්තාන පෙරනිමියෙන්ම සිංහල හා දෙමළ භාෂාවන්ට යුනිකෝඩ් සහය දක්වන නිසා අලුතින් සිංහල ස්ථානය කරන්න අවශ්‍ය නැහැ.

ඉහළට

22.හන්තාන මත mp3, mp4, avi වාදනය කළ හැකි ද?

ඔව් හන්තාන පෙරනිමියෙන්ම බොහෝ බහුමාධ්‍ය ගොනු වර්ග සඳහා සහාය දක්වනවා. හන්තාන ස්ථාපනය කළ වහා ම ඔබට ඒවා වාදනය කළ හැකියි.

ඉහළට

23.හන්තාන සඳහා skype ස්ථාපනය කළ හැකිද?

හන්තාන සමඟින් skype පෙරනිමියෙන්ම ලැබෙනවා. අමුතුවෙන් ස්ථාපනය කරන්න දෙයක් නැහැ.

ඉහළට

24.හන්තාන සමඟ එන LibreOffice වල Office2007 ගොනු විවෘත කළ හැකි ද?

ඔව් හන්තාන මත දැනට OfficeXP, Office2003 සහ Office2007 ගොනු විවෘත කිරීමට පහසුකම් සහ OfficeXP, Office2003 සහ Office2007 මඟින් යළි විවෘත කිරීමට හැකිවන ලෙස සුරැකීමේ පහසුකම ද තියෙනවා.

ඉහළට

25.MS Windows සමඟ හන්තාන එකම පරිගණකයේ ස්ථාපනය කළ හැකි ද? එමගින් පරිගණකයේ වේගය අඩු වේවිද ?

ඔව්, හන්තාන කලින් MS Windows ස්ථාපනය කළ පරිගණකය ස්ථාපනය කළ හැකියි. මෙය හඳුන්වන්නෙ ද්විත්ව ස්ථාපන (dual boot) නමින්. අනෙක් මෙහෙයුම් පද්ධතිය MS Windows හැර වෙනත් එකක් වෙන්නත් පුළුවන්. ද්විත්ව ස්ථාපනය සිදු කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා ස්ථාපන සටහන් බලන්න.

මෙහි දී පරිගණකයේ වේගයට බලපෑමක් වෙන්නෙ නැහැ. ද්විත්ව ස්ථාපනයක් කර ඇති අවස්ථාවක පරිගණකය ආරම්භ කිරීමේදී (booting) ඔබට භාවිත කිරීමට අවශ්‍ය කුමන මෙහෙයුම් පද්ධතිය ද යන්න ඔබෙන් විමසනවා. වරකට ක්‍රියාත්මක වන්නේ එක් මෙහෙයුම් පද්ධතියක් පමණයි. මෙහි දී බලපාන එකම සාධකය වන්නේ මෙහෙයුම් පද්ධති දෙක සඳහා ප්‍රමාණවත් ඉඩක් ඔබේ හාඩ් ඩිස්ක් එක තුළ තිබිය තිබීමයි.

ඉහළට

26.වෛරස්ගාඩ් එකක් අවශ්‍ය ද?

අත්‍යවශ්‍ය නැහැ. ලිනක්ස් මෙහෙයුම් පද්ධතිවලට වෛරස් මඟින් සිදුවන හානි අනෙක් මෙහෙයුම් පද්ධති වලට සාපේක්ෂව ඉතාමත් අඩුයි. පසුගිය වසර 18 ක කාලය තුළ ලිනක්ස් කර්නලයට බලපෑ හැකි ආකාරයේ වෛරස නිකුත් වුණේ අතේ ඇඟිලි ගණනටත් අඩුවෙන්.

ඉහළට

27.මගේ ඩොංගල් එකෙන් ඉන්ටනෙට් යන්න Mobile Partner ස්ථාපනය කරන්න ඕනද? ඒ වෙනුවට වෙන විසඳුමක් තියෙනවද?

ස්ථාපනය කරන්න අවශ්‍ය නැහැ, ඩොංගල් එක පරිඝණකයට සම්බන්ධ කළ සැනින් Network Manager විසින් එය ස්වයංක්‍රීයව හඳුනාගන්නවා.

ඉහළට

28.හන්තාන ලිනක්ස් තියන ගැටලු විසඳා ගන්නේ කොහොමද?

මෙ සදහා හන්තාන ගූගල් සමූහයට සම්බන්ධ වී එහි දී ඔබෙ ප්‍රශ්න මතු කොට අපේ ප්‍රජාවෙ සාමාජික සාමාජිකාවන්ගෙන් විසඳුම් ලබාගන්න පුළුවන්. හන්තාන ගූගල් සමූහයට සම්බන්ධ වීම සඳහා මෙම සබැදිය පාවිච්චි කරන්න http://groups.google.com/group/hanthana-community . www.hanthana.org/irc.php මඟින් හන්තාන IRC නාලිකාවට සම්බන්ධ වී සජීවී ලෙස සහාය ලබාගත හැකියි.

ඉහළට

29.මට ඊමෙල් ගොඩක් එන එක කරදරයි හන්තාන අඩවියේ අලුත් තොරතුරු පමණක් ගන්න ක්‍රමයක් නැද්ද?

ඔව් පුළුවන්. හන්තාන පුවත් සමූහයට දායක වීමෙන් අවශ්‍ය නිවේදන පමණක් ලබාගත හැකියි.

https://groups.google.com/group/hanthanalinux

ඉහළට

30.මට හන්තාන ව්‍යාපෘතියට සහාය විය හැකි ද?

1. පාසැලේ, කාර්යාලයේ මිතුරන් දැනුවත් කිරීම

2. හන්තාන සජීවි තැටිය නැදෑ හිතමිතුරන් අතරේ බෙදා දීම

3. දැනුවත් කිරීමෙ වැඩසටහන් සංවිධානය සහ ඒවාට සහභාගී වීම

4. හන්තාන මත මෘදුකාංග භාවිතවන ආකරය ගැන සරල බසින් සටහන් සැකසීම

5. මෘදුකාංග සිංහල බසට පරිවර්තනය

6. ප්‍රජාවට අවශ්‍ය වන සහ නියමිත බලපත්‍ර සහිතව ඔබ නිපදවූ සුදුසු මෘදුකාංග හන්තාන ව්‍යාපෘතියට එක් කරන්නත් ඔබට අවස්ථාව තිබෙනවා

අනිවාර්යයෙන්ම පුළුවන්. ඔබට පහසුම ක්‍රමය හන්තාන ලිනක්ස් ඔබෙ පාසැලේ, අධ්‍යාපන ආයතනයේ, කාර්යයාලයේ මිතුරන්ට හන්දුන්වා දෙන එක, නැහිත මිතුරන් අතරේ බෙදාහරින එක. ඔවුන්ගේ පරිගනක වල හන්තාන ලිනක්ස් ස්ථාපනයට සහාය වන එක. එමෙන්ම ඔබෙ පාසැලේ, ආයතනයෙ මෙ පිළිබඳ වැඩසටහන් සූදානම් කළවිට වැඩි දුර දැනුවත් කිරීම හා පුහුණු වැඩමුළු සඳහා හන්තාන කණ්ඩායම ගෙන්වාගත හැකියි.

එසේ ම නිදහස් මෘදුකාංග භාවිතය පිළිබඳ සිංහලින්, දෙමළින් සහ ඉංග්‍රීසියෙන් සරලව සටහන් සැකසීම සඳහා දායක වීමෙන් ඔබෙ දැනුම ප්‍රජාව වෙත දෙන්නත් පුළුවන්.

වැඩිදුර තොරතුරු සඳහා අපගේ ගූගල් සමූහයට එකවන්න.

ඉහළට

## ස්ථාපනය

**1.** හන්තාන ස්ථාපනය කරගන්න අවශ්‍ය අවම දෘඩාංග පහසුකම් මොනවා ද**?**

අවම වශයෙන් පහත දැක්වෙන මට්ටමෙ පවතිනවා නම් ඔබෙ කටයුතු හන්තාන මත වඩාත් පහසුවෙන් හා

වේගවත් ව කරගන්න පුළුවන් :

පෙළ ආකාරය සඳහා (text-mode) අනුමත : 200 MHz Pentium Pro හෝ වැඩි

චිත්‍රක ආකාරය සඳහා (graphical) අනුමත : 400 MHz Pentium Pro හෝ වැඩි

පෙළ ආකාරය සඳහා (text-mode) අවම මතකය (RAM): 256 MiB

චිත්‍රක ආකාරය සඳහා (graphical) අවම මතකය (RAM): 640 MiB

චිත්‍රක ආකාරය සඳහා (graphical) අනුමත මතකය (RAM): 1152 MiB

දෘඪ තැටියෙහි තිබිය යුතු අවම හිස් ඉඩකඩ 15GB DVD ධාවකයක්

ඉහළට

**2.** හන්තාන ගන්නේ කොහොම ද**?**

හන්තාන ලබාගැනීම ඉතාම පහසුයි.

ඔබ කළ යුත්තේ http://www.hanthana.org වෙබ් අඩවියට පිවිසී Hanthana DVD iso එක බාගෙන DVD එකකට පිටපත් කරගැනීමයි. ඔබගේ මිතුරෙකු සතුව දැනටමත් හන්තාන ලිනක්ස් DVD එකක් තිබෙනම් එයින් පිටපතක් ලබා ගැනීමද සිදු කළ හැකියි. මෙ සඳහා කිසිදු නීතිමය බාධකයක් නැහැ. ඉහත සඳහන් එක් ක්‍රමයකට හෝ පිටපත් ලබා ගැනීමට ඔබට අපහසු නම් http://hanthana.org/media.php හි සිටින හන්තාන ලිනක්ස් මාධ්‍ය දායකයින්ගෙන් ඔබට වඩාත්ම ආසන්න පුද්ගලයා අමතන්න. ඔහු/ඇය ඔබට පිටපතක් ලබාදීමට ඔහුගේ/ඇයගේ උපරිම උත්සාහය දරනු ඇති.

ඉහළට

3. හන්තාන බිට් **64** පරිගණක මත **(AMD-64** හෝ **Intel-64)** ක්‍රියාත්මක කළ හැකිද**?**

ඔව් පුළුවන්. මෙ සඳහා හන්තාන අඩවියෙන් හන්තාන ලිනක්ස් x86_64 සජීවී තැටිය භාවිත කරන්න.

ඉහළට

**4.** හන්තාන ස්ථාපනය කරන්නේ කොහොමද**?**

නිවාස බහලුම (home directory) තුළ ඇති HanthanaDocs උප-බහලුම තුළ ඇති "Installation-Guide-H15-si.pdf" ගොනුව විවෘත කිරීම මගින් අවශ්‍ය ස්ථාපන උපදෙස් ලබා ගත හැක.

ඉහළට

5. කොහොමද හන්තාන ඩුවල් බූට් ලෙස දාන්නේ

මෙ සඳහා ස්ථාපන සටහන් බලන්න. එහි විස්තර කර ඇත්තේ ඩුවල් බූට් ලෙස හන්තාන ස්ථාපනය කරන ආකරයයි. මෙහිදී පාටිෂන් කිරීමෙ පියවරේදී වඩාත් සැලකිලිමත් වෙන්න.

ඉහළට

**6.** මගේ **NTFS (Windows NT/2000/XP/2003)** පාටිශන් බලාගන්නේ කොහොමද**?**

ස්ථාපන පියවර වල පාටිශන් කරන පියවරේදී ඔබගේ දැනට පවතින පාර්ටිශන් වගුව දක්වනවා. NTFS පාටිශන් එම වගුවේ 'Type' යටතේ ntfs ලෙස පෙන්වනුඇති. වැඩි විස්තර සඳහා ස්ථාපන සටහනේ පාර්ටිශන් කිරීමෙ කොටස බලන්න.

ඉහළට

# Desktop සැකසුම්

1. **Desktop Effects / ඩෙස්ක්ටොප් රංගසැරසිලි සක්‍රිය කරන්නේ කොහොමද?**

   හන්තාන 15 නිකුතුවේදි මින් පෙර තිබූ Desktop Effects (ඩෙස්ක්ටොප් රංගසැරසිලි) භාවිත කළ නොහැක. නමුත් හන්තාන 15 නිකුතුව Fail Safe Mode ආකාරයට පිවිසීමෙන් හන්තාන 14 නිකුතුවේ පරිදි ඩෙස්ක්ටොප් එක භාවිත කළ හැක. එහිදී Desktop Effects (ඩෙස්ක්ටොප් රංගසැරසිලි) ද පෙර පරිදිම භාවිත කළ හැක.

   ඉහළට

2. **පරිගණකය වසාදමන්නේ කොහොමද? Shutdown තිබෙන තැන හොයාගන්න බෑ.**

   තිරයේ දකුණුපස ඉහළ කෙළවරේ ඇති පරිශීලක නාමය මත ක්ලික් කර ලැබෙන මෙනුවෙන් Shut down... යන්න තේරීම සිදු කරන්න.

   එහෙම නැත්නම් Alt+F2 එබූ විට ලැබෙන කවුළුවේ halt යනුවෙන් ටයිප් කොට "Enter" යතුර ඔබන්න.

   ඉහළට

# කාර්යාලීය යෙදුම්

1. **හන්තාන එකේ තියෙන LiberOffice වලින් ලියුමක් ලියලා මම MS Office තියෙන පරිගණකයකට ගෙනියන්නේ කොහොමද?**

   LibreOffice වල ලේඛනයක් MS Office ලෙස සුරැකීමේ පහසුකම තියෙනවා. මේ සඳහා File > Save As... හි File type යටතේ Microsoft Word, Microsoft Excel ආදී ඔබට අවශ්‍ය ආකාරය තෝරා ඒ ආකෘතියෙන් ලිපිය සුරැකීම සිදු කරන්න පුළුවන්. මෙසේ සුරැකි ලිපි ඔබට MS Office තිබෙන පරිගණකයක් තුළ විවෘත කරන්නත්, සංස්කරණය කරන්නත් පුළුවන්.

   ඉහළට

2. **ලියුමක් PDF බවට පත් කරගන්න පුළුවන්ද?**

   ඔව් පුළුවන්. මේ සඳහා File > Export as PDF... මෙනු අයිතමය තේරීමෙන් ලැබෙන කවුළුව භාවිතා කරන්න පුළුවන්. මෙහිදී ඔබට අවශ්‍ය පරිදි සිටවුම් (Settings) කරන්න පුළුවන්. නමුත් බොහෝ විට සාමාන්‍ය PDF ගොනුවක් සෑදීම සඳහා මෙම පෙරනිමි සිටවුම් ප්‍රමාණවත්. ඉන්පසු Export බොත්තම ඔබන්න. ලැබෙන කවුළුවේ ඔබට PDF ගොනුව සුරැකීමට අවශ්‍ය ස්ථානය සහ ගොනු නාමයක් ලබා දී Save බොත්තම ක්ලික් කරන්න.

   ඉහළට

3. **LiberOffice විතරද? ඇයි OpenOffice.org නැද්ද?**

   හන්තාන 14.7 නිකුතුවේ සිට අඩංගු වන්නේ LibreOffice වන අතර මෙය මීට පෙර භාවිත කළ OpenOffice.org නිර්මාණය කළ ප්‍රජාව විසින් ඉදිරියට ගෙන යන ව්‍යාපෘතියකි.

   ඉහළට

4. **සිංහලෙන් ලියන්නේ කොහොමද?**

   හන්තාන ලිනක්ස් පද්ධතියේ පෙරනිමියෙන්ම සිංහල (යුනිකෝඩ්) සඳහා සහාය දක්වනවා. ඔබට යතුරු ලියනය කිරීම සඳහා ක්‍රම දෙකක් භාවිත කරන්න පුළුවන්. ඒ තමයි සම්මත විජේසේකර යතුරුපුවරුව සහ ෆොනටික් ක්‍රමය (අකුරේ හඬ අනුව ඇතුළත් කිරීම).

   ඔබ දැනටමත් හන්තාන වෙත පිවිසී ඇත්තේ සිංහල අතුරු මුහුණතෙන් නම් Ctrl + Space එබීමෙන් ඔබට සිංහල ලිවීමේ ආකාරයට මාරු විය හැකියි. ඔබ පිවිසී ඇත්තේ ඉංග්‍රීසි අතුරු මුහුණතට නම් Activities මත ක්ලික් කිරීමෙන් ලැබෙන මෙනුවේ Other > Input Method Selector තෝරාගන්න තවද Alt+F2 යතුරු මඟින් ලබා දෙන ලැබෙන කවුළුවේ im-chooser ලෙස යතුරු කර Enter යතුර ඔබන්න. ඉන්පසු ලැබෙන කවුළුවේ Use

IBus (recommended) යන්න සක්‍රිය කරන්න. ඉන්පසු එම කවුළුවේ ඇති Input Method Preferences.. බොත්තම ඔබන්න. ලැබෙන කවුළුවේ Input Method ටැබයේ ඇති Select at input method මෙනුවෙන් Show all input methods මත ක්ලික් කර ඉන්පසු ලැබෙන දිගු ලැයිස්තුවෙන් Sinhala;Sinhalese යටතේ ඔබට අවශ්‍ය ආදාන ආකාර (Input Method) එකක් හෝ කිපයක් (විජේසේකර, සයුර වැනි) තෝරන්න. මෙහිදී අවශ්‍ය ඇතුලත් කිරීමේ ක්‍රමය තෝරා Add බොත්තම ඔබන්න. ඉන් පසු එම කවුළු දෙකම වසන්න. සිංහල ලිවීමේ ආකාරයට මාරු වූ පසු එක් එක් ආදාන ආකාර අතර මාරු වීම සඳහා (විජේසේකර, සයුර වැනි) Alt + Shift යතුරු භාවිතා කරන්න.

ඉහළට

5. **සිංහලෙන් ලියන්න මම ෆොන්ට දාගන්න ඕනද?**

හන්තාන සමඟ LKLUG සිංහල (යුනිකෝඩ්) පෙරනිමියෙන්ම ලැබෙන නිසා අමුතුවෙන් ෆොන්ට ඇතුළත් නොකර සිංහලෙන් යතුරු ලියන්න පුළුවන්. ඒත් අමතර ෆොන්ට පරිගණකයට ඇතුළු කරගැනීමට කිසිම බාධාවක් නැහැ.

ඉහළට

6. **LibreOffice** මත සිංහල අකුරු **bold** කිරීමේ සහ **"ශ්‍රී"** වැනි අකුරු ලියවෙන්නේ **"ශ්රී"** ලෙස ලියවෙන ගැටුව විසදිය හැකි ද**?**

මෙය අක්ෂර සැකැස්ම තෝරාගැනීම පිලිබඳ ගැටළුවක් වන අතර සරල පියවර කිහිපයකින් නිවැරදි කරගත හැක. LibreOffice විවෘත කරන්න. දැන් ප්‍රධාන මෙනුවේ Tools > Options... > තෝරා ලැබෙන කවුලුවේ වම්පස ඇති Language Setting යටතේ ඇති Languages තොරාගන්න.

එහි Enhanced Language support කොටස යටතේ ඇති Enabled for Asian languages හා Enabled for complex text layout (CTL) සක්‍රිය කර Default languages for document යටතේ ඇති Western , Asian හා CTL පරාමිති [None] බවට හරවන්න.

ඉහළට

## මෘදුකාංග කළමනාකරණය

1. හන්තාන මත මෘදුකාංගයක් ස්ථාපනය කරන්නේ කොහොමද **?**

Activities > System (පද්ධතිය) > Administration (කළමනාකරණය) > Add/Remove Software යටතේ අවශ්‍ය මෘදුකාංගය තෝරා “Apply” බොත්තම එබීමෙන් පහසුවෙන්ම ස්ථාපනය කලහැකියි. ඔබට අවශ්‍ය මෘදුකාංගය වෙනත් මෘදුකාංග මත යැපෙයි නම්, එවිට ඒවාද ස්ථාපනය කිරීමේ අවසරය ඔබෙන් ඉල්ලනු ඇති. ඔබට root ගේ මුරපදය ලබා දීමට සිදුවෙනවා.

නැතහොත්, ටර්මිනලයේ su -c “yum install <මෘදුකාංගයේ නම>” ලෙස විධානය ලබා දීමෙනුත් මෙම කාර්යය ඉටු කර ගතහැකියි. ඔබට root ගේ මුරපදය ලබා දීමට සිදු වනු ඇති. මෙහිදී ලබා දිය යුතු මෘදුකාංගයේ නම, Fedora මෘදුකාංග ගබඩාවේ ඇති නම විය යුතු අතර එම නම ජනප්‍රිය නාමයෙන් වෙනස් විය හැකි බව කරුණාවෙන් සලකන්න.

ඉහත ආකාර දෙකෙන් ම මෘදුකාංග ස්ථාපනය කිරීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවක් තිබීම අවශ්‍යයි.

ඔබ Fedora සඳහා වන RPM මාදිලියේ ගොනුවක් ලබාගත්තේ නම්, su -c “yum localinstall --nogpgcheck “ විධානය හෝ su -c “rpm -ivh ” විධානය ලබාදී එය ස්ථාපනය කරගත හැකියි. මෙහි දීත් ඔබට root ගේ මුරපදය ලබා දෙන්න සිදු වෙනවා.

මීට අමතරව වෙනත් ඕනෑම ලිනක්ස් මෙහෙයුම් පද්ධතියකදී මෙන් අදාළ මෘදුකාංගයේ මූලය (source) ලබාගෙන එය ස්ථාපනය කිරීමේ හැකියාව ද තියෙනවා.

ඉහළට

2. හන්තාන තුළ ඇති මෘදුකාංග යාවත් කාල කරන්නේ කොහොම ද**?**

Activities > System Tools (පද්ධති මෙවලම්) > Add/Remove Software යටතේ යාවත්වීම් සපයා ඇති මෘදුකාංග පෙන්වනු ඇති. Update බොත්තම එබීමෙන් ඔබේ පද්ධතිය යාවත් කල හැකියි. මෙහි දීත් root ගේ මුරපදය

ලබාදීම අවශ්‍යයි.

එසේ නැතිනම්, ටර්මිනලය මත su -c “pkcon update” විධානය (හා අවශ්‍යය විටදී root පරිශීලකගේ මුරපදය) ලබාදීමෙනුත් යාවත්කාල කරන්න පුළුවන්.

ඉහළට

3. හන්තාන තුළ ඇති මෘදුකාංග ඉවත් කරන්නේ කොහොමද**?**

   Activities > System Tools (පද්ධති මෙවලම්) > Software Update යටතේ අවශ්‍ය මෘදුකාංගය තෝරා ඉවත් කර “Apply” බොත්තම එබීමෙන් පහසුවෙන්ම ඉවත් කළ හැකියි. ඔබට මෙහිදීත් root ගේ මුරපදය ලබාදෙන්න සිදු වෙනවා.

   නැතහොත්, ටර්මිනලයේ su -c “yum remove <අවශ්‍ය මෘදුකාංගයේ නම>” ලෙස විධානය ලබා දීමෙන්ද මෙම කාර්යය ඉටු කර ගත හැක. ඔබට root ගේ මුරපදය ලබාදීමට සිදුවනු ඇති.

ඉහළට

4. හන්තාන තුළ **exe** ගොනු ස්ථාපනය කළ හැකිද **?** කොහොමද කරන්නේ**?**

   exe සහ msi ගොනු යනු, Microsoft Windows මෙහෙයුම් පද්ධතිය සඳහා ඇසුරුම් කරන ලද ගොනු වර්ගයි. මේ හැම ගොනුවක්ම Linux පද්ධතියක් සමඟ භාවිත කළ හැකි ද යන්න කල්තබා තහවුරු කිරීමේ හැකියාවක් නැ. ඒත් මේ වර්ගවල ගොනු බොහොමයක් wine නම් මෘදුකාංගය උපකාරයෙන් ස්ථාපනය කරන්න පුළුවන්.

   Activities > Other (වෙනත්) යටතේ wine සමඟ ස්ථාපනය කළ යෙදුම් දක්නට ලැබේ.

   දැන් ස්ථාපනය කරගැනීමට අවැසි මෘදුකාංගය සහිත exe හෝ msi ගොනුව රයිට් ක්ලික් කර "Open with Wine Windows Program Loader" යන්න තෝරන්න. දැන් Microsoft Windows මත ස්ථාපනය සිදුවෙන ආකාරයටම ස්ථාපනය සාමාන්‍ය ලෙස සිදුවේවි.

   ස්ථාපනය නොකර ධාවනය කර හැකි exe ගොනුද (උදා:- flash projector ගොනු) රයිට් ක්ලික් කර "Open with Wine Windows Program Loader" යන්න තෝරාගැනීමෙන් ධාවනය කළ හැකියි.

   Wine මගින් ස්ථාපනය කරන ලද මෘදුකාංග වෙත පිවිසීම Activities > Other (වෙනත්) කාණ්ඩය යටතේ ලබා ගත හැක.Wine සමඟ ස්ථාපනය කළ මෘදුකාංග ඉවත් කිරීමට Activities > Other > Wine Software Uninstaller.. තෝරන්න Add/Remove Programs වෙත පිවිස ඉවත් කිරීමට අවැසි මෘදුකාංගය තෝරා Remove ක්ලික් කරන්න.

   Wine හි සැකසුම් වෙනස්කිරීම Activities > Other > Wine Configuration මගින් සිදු කළ හැකියි.

ඉහළට

# ජාල සැකසුම්

1. පරිගණකයේ **IP** ලිපිනය සහ අනෙකුත් තොරතුරු දෙන්නේ කොහොමද**?**

   පරිගණක ජාලයකට සම්බන්ධ වෙන්නට නම් ඔබේ පරිගණකයට IP ලිපිනයක් සහ තවත් ඒ හා සම්බන්ධ සැකසුම් කිහිපයක් තිබෙන්නට අවශ්‍යයි. එසේ සැකසෙන්නට ප්‍රධාන ක්‍රම දෙකක් ඇත. එක් ක්‍රමයකදී ඔබ ඒ සැකසුම් සඳහා අගයන් ලබා දිය යුතු අතර අනෙක් ක්‍රමයේදී අදාළ සැකසුම් පරිගණක ජාලයෙන්ම ලබාගැනීමේ හැකියාව (DHCP භාවිතයෙන්) තිබෙනවා.

   ජාලයන් ස්වයංක්‍රිය ලෙස සැකසුම් ලබා ගැනීම සඳහා DHCP (Dynamic Host Configuration Protocol) භාවිත වන අතර, ඒ සඳහා ඔබ සම්බන්ධවන ජාලයේ DHCP සේවාව ලබාදෙන සේවාදායකයෙකු තිබිය යුතුයි. විශේෂයෙන්ම ඔබේ ජාලය රැහැන් රහිත එකක්නම් බොහෝදුරට එහි DHCP සේවාව තිබිය හැකියි. එසෙ නැති නම් ඔබට සුදුසු IP ලිපිනයක් පරිගණකය සඳහා තෝරාගැනීමට සිදුවේ. මේ සඳහා ඔබේ අන්තර්ජාල සේවා සපයන්නා හෝ පරිගණක පද්ධති/ජාල පරිපාලකගේ උපදෙස් පැතීම වඩා යෝග්‍යයි.

   DHCP සේවාව ඇති ජාලයක ඒ සේවාව භාවිතයෙන් ජාලයට සම්බන්ධ වීම සඳහා ඔබේ පරිගණකයට අදාළ

ජාල රැහැන් (ඇතිනම්) සවිකිරීමෙන් අනතුරුව තිරයේ ඉහළ ඇති ප්‍රධාන පැනලයෙන් NetworkManager අයිකනය ක්ලික්කර රැහැන් සහිත ජාලයක් සඳහානම් Wired ටැබයද, රැහැන් රහිත ජාලයක් සඳහානම් Wireless ටැබයද තෝරන්න. එහිදී අදාල ජාල සබඳතාව සක්‍රිය කර ගැනීමට අවකාශ ලැබේ .

ප්‍රධාන පැනලයේ දකුණු පස ඇති පරිශීලක නාමය මත ක්ලික් කිරීම මඟින් ලැබෙන මෙනුවෙන් System Settings තෝරන්න. දැන් Hardware යටතේ ඇති Network තේරූ විට සම්බන්ධතාවයේ තොරතුරු පෙන්වනයි. උදාහරණයක් ලෙස රැහැන් සහිත ජාලයක් හරහා DHCP මඟින් සම්බන්ධවී ඇත් නම් කිසිදු සැකසුමක් නොකරම Hardware Address, Speed, IP Address, Subnet Mask, Default Route, සහ DNS යන තොරතුරු පෙන්වයි.

නමුත් ඔබේ පරිගණකයට අදාල සැකසුම් ලබා දීම සඳහා Wired, Wireless සහ Network Proxy යන කාණ්ඩ 3 න් Wired කාණ්ඩය තොරා එහි ඇති ඇති ස්විචය එබීම මඟින් ON තත්ත්වයට පත්කරන්න. දැන් පහත ඇති Option බොත්තම එබූ විට ලැබෙන කවුලුවෙන් Wired, 802.1x Security, IPv4 Settings සහ IPv6 Settings යන ටැබ් 4 දිස්වෙනු ඇත. එයින් IPv4 Settings ටැබය තෝරන්න. දැන් Method යටතේ ඇති පහළට දිග හැරෙන මෙනුවෙන් Automatic (DHCP) හෝ Manual යන්න තෝරාගත හැක.

ඔබේ පරිගණයට ස්වයංක්‍රියව IP ලිපින තොරතුරු ලබා දීම සඳහා DHCP සේවාව ලැබේ නම් Automatic (DHCP) ද එසෙ ස්වයංක්‍රියව IP ලිපින තොරතුරු නොලැබේ නම් Manual යන්නද තෝරාගන්න.

ස්වයංක්‍රියව IP ලිපින දීම සඳහා Method යටතේ Automatic (DHCP) යන්න තෝරාගන්න. පරිගණකය පනගන්වන හැම විටම එම ජාල සබඳතාව භාවිතා කිරීමට වුවමනානම්, සබඳතාවේ නම සපයන තැනට පහලින් ඇති Connect automatically සඳහා සලකුණු කරන්නන. අවසානයේදී, Save බොත්තම ඔබා මේ කල සැකසුම් තහවුරු කරන්න. බොහෝ විට මෙතැනදීද ඔබෙන් root ගේ මුරපදය ලබාදීමට සිදුවනු ඇත.

මෙසේ DHCP සේවාව ලබා දී නැති විටෙක, අදාල තොරතුරු ඔබ විසින් ඇතුල් කල යුතුයි. මේ අගයන් ලබා ගැනීමට ඔබ ඔබේ ජාල/පද්ධති කළමණාකරු හෝ පරිපාලකගෙන් විමසන්න. දැන් Method යටතේ Manual යන අගය තොරා ගන්න. ඉන් පසු Addresses කොටසට අදාලව ඇති Add බොත්තම ඔබන්න. පසුව, IP Address, Netmask සහ Gateway යන සැකසුම් සඳහා අවශ්‍යය කරන අගයන් ලබා දෙන්න. උදා: IP Address: 192.168.110, Netmask: 255.255.255.0 සහ Gateway: 192.168.1.1. මින් පසු, DNS Server සඳහා ඔබගේ ජාලයේ DNS සේවා සපයන්නාගේ IP ලිපිනය ලබා දෙන්න. පරිගණකය පනගන්වන හැම විටම එම ජාල සබඳතාව භාවිතා කිරීමට වුවමනානම්, සබඳතාවේ නම සපයන තැනට පහලින් ඇති Connect automatically සඳහා සලකුණු කරන්න. අවසානයේදී, Save බොත්තම ඔබා මේ කල සැකසුම් තහවුරු කරන්න. බොහෝ විට මෙතැනදීද ඔබෙන් root ගේ මුරපදය ලබාදීමට සිදුවනු ඇත.

මේ ආකාරයෙන් ජාල සබඳතාවය සකසාගත් පසු Network සැකසුම් වසා දමන්න. දැන් ඔබ ජාලයට සම්බන්ධ වීමට සූදානම්.

ඉහළට

2. මගේ **Dongle** එකෙන් අන්තර්ජාලයට යන්නේ කොහොම ද**?**

ඩොංගල් එක පරිගණකයට සම්බන්ධ කරන්න. ටික වෙලාවකින් Network Manager විසින් ඩොංගල් එක හඳුනා ගන්නා අතර එවිට Neteork Manager අයිකනය මත ක්ලික් කලවිට ලැබෙන මෙනුවෙන් Auto broadband ලෙස තෝරන්න. එවිට ඔබේ ඩොංගලයේ නිෂ්පාදක(Manufacturer) හා මොඩලය(Model) සඳහන් කවුළුවක් ලැබේවි. එයින් ඔබ සාදන Mobile BroadBand Connection එක සඳහා භාවිතා කරන්නේ මේ ඩොංගලය පමණක්ද නැතිනම් වෙනත් ඩොංගලයක් භාවිතා කරලත් මෙම සම්බන්ධතාවය භාවිතයට ඉඩ දෙනවද යන්න තෝරා ඉදිරියට යන්න. මීළඟ කවුළුවෙන් අදාල රට ලෙස Sri Lanka තෝරන්න. දැන් ශ්‍රී ලංකාවේ සියළුම ජංගම දුරකථන සමාගම් වල ලැයිස්තුවක් දක්වා ඇති අතර එයින් ඔබගේ අන්තර්ජාල සේවා සම්පාදක (Internet Service Provider) තෝරා ඉදිරියට යන්න. මීළඟ කවුළුවෙන් ඔබ භාවිතා කරන පැකේජය ඇත්නම් එය තෝරන්න. එසේ නොමැතිනම් My plan is not listed විකල්පය තෝරා APN (Access Point Name) නාමය සඳහන් කර ඉදිරියට යන්න. ඔබට මෙම සම්බන්ධතාවය ඩොංගලය පරිගණකයට සම්බන්ධ කරනවාත් සමගම ස්වයංක්‍රියව (Automatically) අන්තර්ජාලය සමඟ සම්බන්ධ වීමට අවශ්‍යනම් Connect Automatically යන්න තෝරන්න.

දැන් ඔබගේ පරිගණකය ඩොංගලය මගින් අන්තර්ජාලය වෙත සම්බන්ධ වීමට සූදානම්. දැන් ඔබ Connect Automatically යන්න තෝරා නොමැතිනම් Network Manager යෙදුම ක්ලික් කර අදාල Mobile BroadBand Connection එක තොරා ක්ලික් කරන්න. දැන් ඔබේ පරිගණකය අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇත.

සමහර අවස්ථාවලදී ඩොංගලයය මගින් අන්තර්ජාලය වෙත සම්බන්ධ වුවත් වෙබ් අඩවි වෙත පිවිසීමට නොහැකි වේ. මෙවිට DNS සේවාදායක(Servers) හඳුනාගෙන ඇත්දැයි පරීක්ෂාකර බලන්න.

ඩොංගලය ආරක්ෂිතව පරිගනකයෙන් ගලවා ඉවත් කරගැනීම සඳහා මුලින්ම Network Manager යෙදුමේ අයිකනය ක්ලික් කර Disconnect යන්න ක්ලික් කිරීමෙන් සම්බන්ධතාවය විසන්ධි කරන්න. දැන් ඩොංගලයට සම්බන්ධ තැටි(Disks) ඇතිනම් ඒවා රයිට් ක්ලික් කර Safety Remove Disk මගින් ඉවත් කරන්න කරන්න. (ස්වයං ස්ථාපන වැඩසටහන සහිත තැටිය[Self Installer Disk], මතක කාඩ පත්[Memory Chip] ආදිය) දැන් ඔබේ ඩොංගලය ආරක්ෂිතව ගලවා ඉවත් කරගත හැක.

ඉහළට

3. හන්තාන ලිනක්ස් ස්ථාපනය කළා, නමුත් අන්තර්ජාලයට පිවිසෙන්න බෑ

මීට හේතුව විය හැක්කේ ඔබේ පරිගණකය Proxy සේවාදායකයක්(Proxy Server) හරහා අන්තර්ජාල සබඳතාවය ලබාගෙන තිබීම විය හැක. ඒ සඳහා ඔබගේ පරිගණක පද්ධති/ජාල පාළකගෙන් අදාල Proxy සේවාදායකයේ IP ලිපිනය හා පෝර්ට්(port) ලබාගන්න.

දැන් පරිශීලක නාමය මත ක්ලික් කර ලැබෙන මෙනුවෙන් System Settings මත ක්ලික් කරන්න. දැන් Hardware යටතේ ඇති Network තෝරන්න. දැන් Network Proxy වෙත පිවිස Manual යන්න තෝරා පරිගණක පද්ධති/ජාල පාළකගෙන් ලබාගත් Proxy සේවාදායකයේ IP ලිපිනය/ලිපිනයන් හා පෝර්ට්(port) ලබාදී කවුළුවෙන්(Window) ඉවත්වන්න. දැන් ඔබේ පරිගණකය සාර්ථකව අන්තර්ජාලය හා සම්බන්ධවී ඇත.

උදා:- ඔබ අන්තර්ජාලය හා සම්බන්ධ වන්නෙ Schoolnet ජාලය මගින් ලබාදී ඇති සබඳතාවයකින්නම් ප්‍රොක්සි සේවාදායකයේ (Proxy Server) IP ලිපිනය ලෙස 10.250.20.20 ත් පෝර්ට් එක (port) 3128 ලෙසත් ලබාදිය යුතුය.

ඉහළට

4. මගේ අන්තර්ජාල සේවාදායකයාගේ **(ISP) DNS** දැනගන්නේ කොහොමද**?**

සමහර අවස්ථාවලදී අන්තර්ජාලය හා සම්බන්ධ වීමේදී DNS (Domain Name Server) සේවාදායක සමහ ස්වයංක්‍රියව හඳුනා නොගන්නා අවස්ථා ඇත. ඔබට අන්තර්ජාලය හා සම්බන්ධ වුවත් වෙබ් අඩවි වෙත පිවිසීමට නොහැකිනම් ඊට DNS සේවාදායක හඳුනා නොගැනීම හේතුවක් විය හැක. DNS සේවාදායක හඳුනාගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීමට Network Manager යෙදුම රයිට් ක්ලික් කර Connection Information වෙත පිවිසෙන්න. එහි Primary DNS, Secondary DNS යනුවෙන් IP ලිපින දෙකක් නොමැතිනම් ඉන් කියවෙන්නේ ඔබේ අන්තර්ජාල සබඳතාවයට අදාල DNS සේවාදායක Network Manager විසින් හඳුනාගෙන නොමැති බවයි. සාර්ථක අන්තර්ජාල සබඳතාවකට අවම අගයෙන් Primary DNS අගය වත් තිබීම වැදගත්.

DNS සේවාදායක සැකසුම් ඔබම සකස් කරගැනීමෙන් මේ ගැටළුව විසඳාගත හැක. ප්‍රධාන පැනලයේ දකුණු පස ඇති පරිශීලක නාමය මත ක්ලික් කිරීම මඟින් ලැබෙන මෙනුවෙන් System Settings තෝරන්න. දැන් Hardware යටතේ ඇති Network යන්න තෝරා ඉන්පසු ලැබෙන කවුළුවෙන් Wired මත ක්ලින් කර ජාලයට අදාල සැකසුම් වෙනස් කිරීම සඳහා Options.. මත ක්ලික් කරන්න. ඉන්පසු ලැබෙන ටැබ් අතරින් IPv4 Settings යටතේ ඇති DNS servers තොරතුරු ලබා දෙන්න. DNS කිහිපයක් දෙද්දි , (කොමාව) මඟින් එකිනෙක වෙන්කර දක් වන්න.

1. රැහැන්රහිත(Wireless) හෝ රැහැන්රහිත(Wired) සබඳතාවයක්නම් Method -> Automatic (DHCP) addresses only ලෙසත්

2. ඩොංගලයක් භාවිතා කර Mobile BroadBand සබඳතාවයක්නම් Method -> Automatic (PPP) addresses only ලෙසත්

3. DSL සබඳතාවයක්නම් Method -> Automatic (PPPoE) addresses only ලෙසත්

තෝරන්න. දැන් DNS Servers හි ප්‍රාථමික(Primary) DNS සේවාදායකයේ IP එක සටහන් කර කොමාවකින් වෙන් කිරීමෙන් පසු ද්විතීක(Secondry) DNS සේවාදායකයේ IP එක සටහන් කරන්න.

ඉහළට

## පරිශීලක කළමනාකරණය

1. මගේ මුරපදය **(password)** වෙනස් කරගන්නේ කොහොම ද**?**

ඉහළ පැනලයේ ඇති පරිශීලක නාමය මත ක්ලික් කර My Account තෝරන්න. ඉන්පසු ලැබෙන User Accounts කවුළුවේ ඔබේ පරිශීලක නාමය, භාෂාව සහ මුරපදය දක්වයි. මුරපදය මත දෙවරක් ක්ලික් කළ විට ලැබෙන කවුළුවේ දැනට ඇති මුරපදය සහ නව මුරපදය ඇතුළත් කරන්න. ඔබ ලබා දෙන මුරපදය සඳහා වන ඉඟිය පද්ධතියට පිවිසුම් තිරයෙ (login screen) පෙන්වන බැවින් පද්ධතියේ සියලු පරිශීලකයන්ට එම ඉඟිය ඔන්වන බව කරුණාවෙන් සලකන්න. එම ඉඟිය සඳහා මුරපදය එක් නොකරන්න. සැකසුම් ලබා දී අවසන් වූ පසු Change බොත්තම ඔබන්න.

එසේ නැත්නම් ටර්මිනලයේ root ලෙස passwd <පරිශීලක නාමය> විධානය ලබා දෙන්න. දැනට පවතින මුරපදය ලබා දී enter ඔබන්න. අලුත් මුරපදය ලබා දී enter ඔබන්න. නැවත අලුත් මුරපදය ලබා දී enter ඔබන්න.

ඉහළට

2. හන්තාන මත අලුතින් ගිණුමක් හදන්නේ කොහොමද **?**

Activities > Other > Users and Groups වෙත පිවිසෙන්න. මෙහිදී ඔබට root මුරපදය ලබාදීමට සිදු වනු ඇත. ලැබෙන කවුළුවේ 'Add User' බොත්තම ක්ලික් කරන්න. ලැබෙන කවුළුවේ පරිශීලක නාමය, පරිශීලකගේ සම්පූර්ණ නම, මුරපදය සහ මුරපදය නැවත ටයිප් කර "OK" බොත්තම ක්ලික් කරන්න.

ඉහළට

3. හන්තාන තුළ ඇති ගිණුමක් මකන්නේ කොහොම ද**?**

Activities > Other > Users and Groups වෙත පිවිසෙන්න. මෙහිදී ඔබට root මුරපදය ලබාදීමට සිදු වනු ඇති. ඔබට මැකීමට අවශ්‍ය ගිණුමේ පරිශීලක නම තෝරා 'Delete' බොත්තම ක්ලික් කරන්න. මෙහිදී එම පරිශීලකට අයිති නිවාස බහලුම (Home Directory), ලිපි අඩංගු බහලුම සහ තාවකාලික ගොනු මැකීමට සටහන් කරන ලද පණිවිඩයක් දිස් වෙනවා. ඔබට මෙවා මැකීමට අවශ්‍ය නම් 'Yes' බොත්තම ක්ලික් කරන්න. ඔබට ඒවා තබා ගැනීමට අවශ්‍ය නම් එම පණිවිඩයේ හරි ලකුණ ඉවත් කර 'Yes' බොත්තම ක්ලික් කරන්න.

එසේ නැත්නම් ටර්මිනලයේ 'userdel <පරිශීලක නාමය>' ලෙස විධානය ලබා දීමෙන් පරිශීලක මැකිය හැක. 'userdel -r <පරිශීලක නාමය>' ලෙස විධානය ලබා දීමෙන් පෙර සඳහන් කල පරිශීලකට අයිති නිවාස ෆෝල්ඩරය, තාවකාලික ගොනු ආදිය මැකිය හැකියි.

ඉහළට

4. හන්තාන තුළ ඇති ගිණුමක් වෙනස් කරන්නේ කොහොමද**?**

Activities > Other > Users and Groups වෙත පිවිසෙන්න. මෙහිදී ඔබට root මුරපදය ලබාදීමට සිදු වනු ඇති. එහි ඔබට වෙනස් කිරීමට අවශ්‍ය පරිශීලක නාමය තෝරා 'Properties' බොත්තම ක්ලික් කරන්න. එහිදී පරිශීලක නාමය, සම්පූර්ණ නම, මුරපදය වැනි තොරතුරුද මුරපදය කල් ඉකුත් විය යුතුද එසේනම් කවදද, කුමන අවස්ථාවලද ආදී සිටවුම්(settings) වෙනස් කිරීමට හැක. අවශ්‍ය වෙනස් කිරීම් සිදු කළ පසුව OK බොත්තම ක්ලික් කරන්න.

ඉහළට

## ආරක්ෂක සැකසුම්

1. මොකක්ද මේ **SELinux?**

SELinux (Security-Enhanced Linux) යනු, Linux මෙහෙයුම් පද්ධති සඳහා සැකසූ ආරක්ෂණ විධික්‍රමයක්. මෙහිදී පද්ධතියේ ක්‍රියාත්මක වන ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය අවසර සීමා කරන අතර මේ සීමා කිරීම් ආරක්ෂාව පිළිබඳ අවදානම විශාල වශයෙන් අඩු කරනවා.

ඉහළට

2. **SELinux** නිසා මගේ එදිනෙදා කටයුතුවලට කුමක් වෙයිද**?**

සාමාන්‍ය භාවිතය සඳහා SELinux සක්‍රිය වීම ගැටලුවක් වෙන්නෙ නෑ. ඒත් සමහර අවස්ථාවල ගැටලු ඇති වෙන්න ඉඩ තියෙනවා. උදාහරණයක් ලෙස, අමතර දෘඪ තැටියක් (Hard Disk) සවිකරන විට, ලිනක්ස් මෙහෙයුම් පද්ධති දෙකක් SELinux භාවිත කරමින් /home පොදුවේ භාවිත කරන විට, සමහර මෘදුකාංග

ස්ථාපනයට හා භාවිතයට.

ඉහළට

3. **SELinux සක්‍රිය/අක්‍රිය කරන්නේ කොහොමද ?**

ප්‍රධාන මෙනුවෙන් Activities > Other > SELinux Management වෙතට පිවිසෙන්න

මෙහිදී Status යටතේ System Default Enforcing Mode යන්න Enforcing හෝ Permissive ලෙසට ඇත්නම් එය Disabled ලෙසට වෙනස් කරන්න.

ඉහළට

# ජංගම දුරකථන සැකසුම්

1. මගේ ජංගම දුරකථනයේ/ඩොංගලයේ ඇති **SMS** සහ **Contacts** මට හන්තාන මතදී බලාගත හැකිද**?**

මෙ සඳහා ඔබට Wammu යෙදුම උපකාර වෙනවා. මුලින්ම ඔබ ඔබේ ජංගම දුරකතනය හෝ ඩොංගලය පරිගණකයට සම්බන්ධ කර Activities > Applications > Accessories > Wammu මගින් Wammu වෙත පිවිසෙන්න. බොහෝ අවස්ථාවලදී ඔබ ජංගම දුරකතනයට හෝ ඩොංගලයට අදාල සැකසුම් Wammu මත සකස්කර නොමැතිනම් සැකසුම් සකස් කිරීම අවශ්‍යදැයි Wammu ඔබෙන් විමසන අතර එසේ නොමැතිනම් Wammu -> Phone wizard වෙත පිවිසෙන්න. මීළඟට දිස්වන කවුළුවෙන්(Window) Next ක්ලික් කර ඉදිරියට යන්න. මෙහිදී සැකසුම් විකල්ප(Options) තුනක් ලබාදී ඇති අතර එයින් වඩා පහසු Automatically search for a phone යන්න ක්ලික් කර ඉදිරියට යන්න. මීළඟට ඔබ ජංගම දුරකතනය හෝ ඩොංගලය පරිගණකයට සම්බන්ධ කර ඇති ආකාරය තෝරාගෙන ඉදිරියට යා යුතුයි. (උදා:- ජංගම දුරකතනයක්නම් පරිගණකය හා සම්බන්ධ කරගනු ලබන්නේ Bluetooth හරහාද, USB කේබලයක් මගින්ද යන්න) මෙහි දක්නට ලැබෙන වෙබ් අඩවි සබැඳිය (Web URL) වෙත පිවිසීමෙන් ඔබගේ ජංගම දුරකථනයට හෝ ඩොංගලයට Wammu සහයෝගය දක්වන්නේද යන්න පරීක්ෂා කළ හැකියි. ඉන් පසු ලැබෙන කවුළුවෙන් ජංගම දුරකථනය හෝ ඩොංගලය Wammu විසින් හඳුනාගන්නාතුරු මදක් ඉවසා රැදී සිටින්න. අනතුරුව Configuration done යනුවෙන් කවුළුවක් ලැබෙන අතර ඉන් කියැවෙන්නේ Wammu ඔබේ ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ සම්බන්ධවීමට සූදානම් බවයි. දැන් Finish ක්ලික් කර සැකසුම් සුරකින්න.

පෙරනිමියක්(default) ලෙස Wammu ආරම්භයේදීම ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ සම්බන්ධ(Connect) වන්නේ නැති අතර ඔබට Wammu ආරම්භයේදීම ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ සම්බන්ධවීමට අවැසිනම් Wammu -> Settings -> Automatically connect to phone at startup විකල්පය තෝරාගත යුතුයි. එසේ නොමැතිනම් Phone -> Connect මගින් සම්බන්ධ විය යුතුයි. මීළඟට One moment please. connecting to phone.... යනුවෙන් පණිවිඩයක් ලැබෙන අතර එය සැඟවී යාමෙන් කියැවෙන්නේ ඔබේ ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ Wammu සම්බන්ධ වී ඇති බවයි. දැන් Retrieve -> Info මගින් ඔබට ජංගම දුරකතනයේ හෝ ඩොංගලයේ නිෂ්පාදක(Manufacturer), වර්ගය(Model), සිම්පතේ දත්ත(Message Center etc.), IMEI අංකය ආදිය ලබාගත හැක. සමහර අවස්ථාවලදී ඩොංගලයක් අන්තර්ජාලය හා සම්බන්ධ වී ඇති විට Wammu මගින් ඒ සමඟ Contact විය නොහැකි අතර එවිට අන්තර්ජාල සම්බන්ධතාව Network Manager යෙදුම මගින් Disconnct තෝරා විසන්ධි කිරීමෙන් පසු නැවත Wammu මගින් සම්බන්ධ වීමට උත්සාහ කර බලන්න.

ජංගම දුරකතනයක් හෝ ඩොංගලයක් සමඟ සම්බන්ධ වුවත් එහි ඇති Contacts, SMS ආදිය Wammu නොකියවන බැවින් Retrieve -> Contacts (All) මගින් දුරකතන මතකයේ(Phone memory) මත හා සිම්(SIM) පතේ ද ඇති සියළුම Contacts wammu වෙත ආයාත(Import) කරගනී. මෙතැනදී ඔබට අවැසි වන්නෙ දුරකතන මතකයේ ඇති Contacts පමණක්නම් Retrieve -> Contacts (Phone) යනුවෙන්ද, සිම් පතේ Retrieve -> Contacts පමණක්නම් Contacts (SIM) යනුවෙන්ද තෝරාගත යුතුයි. Contacts කියැවීම, සංස්කරණය(Edit), මැකීම(Delete) ආදිය මෙහිදී ඔබට කළ හැකි අතර අලුතින් Contacts එකතුකරගැනීම සඳහා Create -> Contact අනුගමනය(Follow) කරන්න.

ඔබට SMS කියවීම සඳහා ද Retrieve -> Messages මගින් SMS ආයාත(Import) කරගත හැකියි. දැන් කවුළුවේ(Window) වම්පසින් ඇති තීරුවේ Messages තුල Read, Sent, Read, Unsent ලෙස SMS වර්ග කර ඇත. SMS කියැවීම, මැකීම(Delete) ආදිය මෙහිදී කළ හැකියි. SMS යැවීම සඳහා Create -> Message තෝරාගන්න. දැන් SMS පණිවුඩය ලබන්නා(Recipient) Recipient හි දුරකතන අංකය ලබාදීමෙන් හෝ Add ක්ලික් කර Contacts වෙතින් තෝරාගත හැක. දැන් OK යන්න ක්ලික් කිරීමෙන් SMS පණිවුඩය යැවිය හැකියි.

Wammu මගින් ලැබෙන SMS එවෙලේම කියවීමට හැකියාවක් නොමැති අතර ඒ සඳහා Gnome Phone Manager භාවිතා කළ හැකියි. ඒ සඳහා Activities > Applications > System Tools > Phone Manager මගින්

පිවිසෙන්න පුළුවන්. Network Manager අයිකනය අසල ඇති ජංගම දුරකතනයක අයිකනය Gnome Phone Manager හි අයිකනයයි. එය රතු පැහැයෙන් යුත් පසුබිමක දිස්වන්නේනම් ඉන් කියැවෙන්නේ ඔබේ ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ සම්බන්ධ වී නොමැති බවයි. එවිට Gnome Phone Manager සැකසුම් සැදිය යුතුයි. ඒ සඳහා Gnome Phone Manager අයිකනය මත රයිට් ක්ලික් කර Preferences තෝරා Connection ටැබය මතදී ජංගම දුරකතනය හෝ ඩොංගලය තොරා ගන්න. ඒ සඳහා ජංගම දුරකතනයක් Bluetooth භාවිත කර සම්බන්ධ වන්නේ නම් කළ යුත්තේ Bluetooth විකල්පය(Option) තෝරා Click to Select device මගින් තෝරාගැනීමයි. එසේත් නොමැත් නම් තිබෙන පහසුම විකල්පය Other port තෝරා Wammu විවෘත කරගෙන Wammu -> Settings -> Connection -> Device මත ඇති අගය පිටපත්(Copy) කර ඇලවීමයි(Paste). ජංගම දුරකතනය හෝ ඩොංගලය සමඟ ඇති සම්බන්ධතාව විසන්ධි(Disconnect) වන අවස්ථාවල දී නැවත ඉබේ(Automatically) සම්බන්ධ වීම සඳහා Automatically retry connections විකල්පය(Option) තෝරාගැනීම වැදගත්. Gnome Phone Manager වෙතින් SMS පණිවුඩයක් ලැබෙන අවස්ථාවලදී එය දිස්වන ආකාරය Interface ටැබය වෙත පිවිසීමෙන් සකසාගත හැකියි. Pop-up window for new messages යන්න තොරාගැනීමෙන් ලැබෙන සෑම SMS පණිවුඩයක්ම නව කවුළුවක(new Window) විවෘත වන අතරම Play sound when messages arrive යන්න තෝරා ගැනීමෙන් SMS පණිවුඩයක් ලැබෙන අවස්ථාවලදී ශබ්දයක් වාදනය වෙනවා.

Gnome Phone Manager වෙත SMS අලුතින් ලැබී ඇත්නම් එය සුදු ලියුම් කවරයක පසුබිමක් ඇති අයිකනයක් මගින් සංකේතවත් කරනවා. එවිට Gnome Phone Manager අයිකනය ක්ලික් කිරීමෙන් SMS කියවිය හැකි අතර එම කවුළුවෙම(Window) ඇති Reply බොත්තම ක්ලික් කිරීමෙන් පිළිතුරු SMS යවන්න පුළුවන්. අලුතින් SMS යැවීම සඳහා Gnome Phone Manager අයිකනය රයිට් ක්ලික් කර Send Message මගින් පණිවුඩය හා ලබන්නා(Recipient) සඳහන් කර Send ක්ලික් කළ යුතුයි.

පරිගණකය ආරම්භයේදීම Gnome Phone Manager ද ආරම්භ විය යුතු නම් System (පද්ධතිය) -> Preferences (අභිප්‍රේත) -> Startup Application විවෘත කර Add ක්ලික් ලැබෙන කවුළුවේ Command යන්නෙහි "gnome-phone-manager" යනුවෙන් සඳහන් කර Add යන්න ක්ලික් කරන්න.

ඉහළට

# වෙනත්

1. **හන්තාන ලිනක්ස්හි touch pad tapping වැඩ කරන්නෙ නෑ. ඒක හදා ගන්නෙ කොහොමද?**

හන්තාන 14 හි Touchpad Click සහ Edge Scrolling ක්‍රියාත්මක කර ගැනීම.

පළමුව ඉහළ පැනලයේ පරිශීලක නාමය මත ක්ලික් කර, System Settings තෝරන්න. දැන් ලෙබෙන කවුලුවෙන් Hardware යටතේ ඇති Mouse and Touchpad තෝරන්න. එහි Touchpad ටැබයට ගොස්, Touchpad Click ක්‍රියාත්මක කර ගැනීමට Enable mouse click with touchpad යන්න ඉදිරියෙන් හරි සලකුණ දමා ගන්න.

Edge Scrolling ක්‍රියාත්මක කර ගැනීමට Scrolling යටතේ ඇති විකල්පවලින් Edge Scrolling යන්න තෝරාගන්න. ඔබගේ පරිගණකයේ Touchpad එක Two-finger scrolling සඳහා සහාය දක්වනවා නම් අදාළ විකල්පය තේරීම මඟින් එය ක්‍රියාත්මක කරගත හැකියි. තවද තිරස් අතට Scroll කිරීමට අවශ්‍ය නම් Enable horizontal scrolling යන්න ඉදිරියේ හරි සලකුණ දමා ගනීමෙන් එයද ක්‍රියාත්මක කරගන්න පුළුවන්.

ඉහළට

2. **මගේ හාඩ් ඩිස්ක් එකෙ ඉඩ බලාගන්නේ කොහොමද?**

Activities > System Tools > System Monitor හි File Systems ටැබයේ ඔබගේ දැනට ඇති පාටිශන් වල ධාරිතාව, හිස් ඉඩ, ගොනු වර්ගය ආදී තොරතුරු පෙන්වයි. මීට අමතරව ඔබට ටර්මිනලයේ ' df -h' විධානය භාවිත කිරීමටත් පුළුවන්.

මෙහිදී System Monitor දෙකක් Gnome සහ KDE ව්‍යාපෘති දෙකෙන්ම ලබා දී ඇති අතර අයික දෙකෙන් පළමුව ඇති අයිකනය මත ක්ලික් කරන්න.

ඉහළට

3. **අන්තර්ජාල වේගය, CPU, Memory භාවිතය බලාගන්නේ කොහොමද?**

Activities > System Tools > System Monitor වෙත පිවිසෙන්න. එහි Resources ටැබයේ ඔබට මෙම තොරතුරු බලා ගත හැකියි.

මෙහිදී System Monitor දෙකක් Gnome සහ KDE ව්‍යාපෘති දෙකෙන්ම ලබා දී ඇති අතර අයිකන දෙකෙන් පළමුව ඇති අයිකනය මත ක්ලික් කරන්න.

ඉහළට

4. **ඩිස්ක් එකේ තියෙන ෆයිල් එකක් හොයාගන්නේ කොහොමද?**

Activities මත ක්ලික් කරන්න. එවිට දකුණු පපස ඉහළින් Type to search... ලෙස සෙවුම් පෙදෙසක් ලැබෙන අතර එය තුළ ඔබට සෙවීමට අවශ්‍ය බහලුමේ, ගොනුවේ හෝ යෙදුමේ නම දෙන්න.

දකුණු පස ඇති File Browser (Nautilus) විවෘත කර එහි ප්‍රධාන මෙනුවේ Go යටතේ ඇති Search for Files.. මත ක්ලික් කරන්න.

ටර්මිනලයේ ' locate' විධානය භාවිතා කරමින් නමින් ගොනුවක් සෙවීමද ' find' විධානය භාවිතා කරමින් ගොනුවේ ප්‍රමාණය, ගොනුවේ අයිතිකරු ආදී බොහෝ පරාමිතීන්ට අනුව සෙවුම් සිදු කිරීමටත් පුළුවන්. locate විධානය භාවිතයට පෙර updatedb විධානය භාවිත කර ඇත්නම් locate විධානයේ පිළිතුර වඩා නිවැරදි පිළිතුරක් ලෙස ලබා ගතහැකියි. එසෙ නොමැති නම් මොහොතකට පෙර මකන ලද ගොනු ආදිය locate විධානයෙන් පෙන්වන ඇති.

ඉහළට

5. **ලිනක්ස්හි විධානයක් පිළිබඳ වැඩි විස්තර සොයාගන්නේ කෙසේද?**

ටර්මිනලයේ 'man <තොරතුරු බලා ගැනීමට අවශ්‍ය විධානයේ නම>' ලෙස විධානය ලබා දීමෙන් එම විධානය පිළිබඳ විස්තරයක්, එහි භාවිතයේ උදාහරණ, ඊට අනුරූප වෙනත් විධාන ආදී තොරතුරු රාශියක් ලබා ගත හැකියි.

උදා: ls විදානයෙන් කෙරෙන්නේ යම් පිහිටුමක ඇති ගොනු හා බහලුම් ලැයිස්තුව පෙන්වීම.

man ls මඟින් ls විධානය පිළිබඳ බොහෝ තොරතුරු ලබාගන්න පුළුවන්.

ඉහළට

6. **හන්තාන සිංහල අතුරු මුහුණතට පිවිසෙන්නෙ කොහොමද?**

හන්තාන පිවිසුම් තිරයේ පරිශීලක නම ක්ලික් කර වම්පස පහළ කෙළවරේ භාෂාව තේරීමේ මෙනුවෙන් (දැනට English (United States) ලෙස පෙන්වා ඇති) Other... තෝරන්න. ලැබෙන භාෂා අඩංගු ලැයිස්තුවෙන් Sinhala (Sri Lanka) තෝරා OK බොත්තම ක්ලික් කරන්න. දැන් ඔබගේ මුරපදය ලබා දී හන්තාන වැඩතලය වෙත පිවිසෙන්න.

ඉහළට

7. **terminal යනු කුමක් ද?**

ලිනක්ස් මෙහෙයුම් පද්ධතිය බාවිතා කිරීමේදී අප දැනගත යුතු ඉතා වැදගත් කරුනක් වනුයේ "ලිනක්ස් ටර්මිනල්" එක භාවිත කරන ආකාරයයි. ලිනක්ස් ටර්මිනලය යනු ලිනක්ස් මෙහෙයුම් පද්ධතියේ පරිඝණකය වෙත විධාන ලබාදීම සඳහා යොදාගනු ලබන ක්‍රමයකි.ෆෙඩෝරා මෙහෙයුම් පද්ධතිය සම්පූර්ණයෙන්ම ග්‍රැෆිකල් පද්ධතියක් උවද ඔබගේ අභිරුචිය පරිදි පරිඝණකය වෙත විධාන ලබාදීම සඳහා ඔබට ටර්මිනල් එකද භාවිතාකල හැකිය. ඔබට ග්‍රැෆිකල් පද්ධතිය භාවිත කර සිදුකරනු ලබන සියලුම විධාන ලබාදීම ටර්මිනල් එක මගින් ද සිදු කළ හැකියි. මෙය ඔබට පළමුව භාවිතා කිරීමේදී අපහසු ලෙස දැනුනත් ඔබ මෙයට හුරුවූ පසු ඔබ ග්‍රැෆිකල් විධාන වෙනුවට ටර්මිනලය බාවිතා කරනු නොඅනුමානයි.

ඔබට ෆෙඩෝරා මෙහෙයුම් පද්ධතිය තුල ටර්මිනල් එකක් විවෘත කරගැනීම ප්‍රධාන මෙනුව වෙත ගොස් පහත ආකාරයට සිදු කළ හැකියි.

Activities > System Tools > Terminal

ඉහළට

8. **root** යනු කුමක් ද**?**

රූට්(root) යනු ලිනක්ස් මෙහෙයුම් පද්ධතියේ සම්පූර්ණ පාලන හැකියාව ඇති මෙහෙයුම් කරුවායි(user). සරලව පැවසුවොත් රූට්(root) ලොගින් එක භාවිතා කිරීමෙන් ඔබට ලින්ක්ස් මෙහෙයුම් පද්ධතිය තුල ඔබට ඕනෑම දෙයක් කිරීමට හැකියාව ලැබේ. අප මෙය සුපර් යූසර්(super user) ලෙසද හඳුන්වනවා.

ඉහළට